# The Applicability of the Buddhist *Chatuskōtika* Theory of Realization of Truth

සත්‍යාවබෝධයෙහි ලා බෞද්ධ චතුෂ්කෝටික තර්කන්‍යායෙහි ඇති අදාළත්වය
(ආදි බෞද්ධ හා මධ්‍යමක දර්ශනය ඇසුරිනි)

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

බුද්ධකාලීන භාරතීය සමාජය දාර්ශනික වශයෙන් නොයෙකුත් මතවාද, දෘෂ්ටි, අන්ත ග්‍රහණයන්ගෙන් යුක්ත වූවකි. එහි දී මිනිසා සත්‍ය සෙවීම සඳහා නොයෙකුත් ක්‍රමවේදයන් උපයෝගී කොටගත්හ. එහි ප්‍රතිඵලයක් ලෙස පූර්වාන්ත කල්පනයත්, අපරාන්ත කල්පනයත් පදනම්ව නිර්මාණය වූ දෘෂ්ටිවාද 62 ක් පිළිබඳ දී. නි. බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වේ.

මෙම සියලු දෘෂ්ටිවාද පිළිබඳ පොදුවේ විමසා බැලීමේ දී ඒවා සියල්ල අන්ත දෙකකට ඇතුළත් වන ආකාරය මූලික සූත්‍ර දේශනා තුළින් දැකගත හැකිය.

***"ද්වයනිස්සිතො බොයං කච්චාන ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච.... සබ්බං අත්ථීති ඛො කච්චාන අයමෙකො අන්තො සබ්බං නත්ථීති අයං දුතියො අන්තො"*** [1]

මේ අනුව ශාස්වත - උච්ඡේද, භව - විභව, පූර්වාන්ත - අපරාන්ත, සයංකත - පරංකත ආදී වශයෙන් විස්තර වන්නා වූ සියලු දෘෂ්ටි ග්‍රහණයන් උක්ත දෘෂ්ටිද්වයෙන් එක් දෘෂ්ටියකට ඇතුළත් වේ. බෞද්ධ තර්ක ශාස්ත්‍රය තුළ මෙය "ද්විකෝටිය" ලෙස හඳුන්වනු ලබයි.

මෙම ද්විකෝටික සංකල්පයයේ සංවර්ධනයක් ලෙස පසුකාලීනව චතුෂ්කෝටික සංකල්පය නිර්මාණය වී ඇත. චතුෂ්කෝටිය තුළින් ද සිදුකරනු ලබන්නේ යම් වස්තුවක පැවැත්මෙහි අන්තය නිර්ණය කිරීමයි. මෙහි දී ආගමික වශයෙන් බුදුදහම තුළ නොයෙකුත් සංකල්ප විග්‍රහ කිරීම සඳහා මෙම චතුෂ්කෝටිය පදනම් කොටගෙන ඇති නමුදු, දාර්ශනික වශයෙන් චතුෂ්කෝටිය බුදු සමයෙන් ප්‍රතික්ෂේප වූවක් බව දැක්විය යුතුය. එහෙයින් බුදුසමය සියලු දෘෂ්ටීන්ගෙන් බැහැර වූ මාධ්‍යමික දර්ශනයක් ලෙස හැඳින්විමට හැකියාව ඇත.

චතුෂ්කෝටික සංකල්පයේ පදනම ලෙස දක්වන න්‍යාය මාර්ග සතරකි. එනම්,

1. ඇත
2. නැත
3. ඇත හා නැත
4. ඇත්තේ ද නොවේ නැත්තේ ද නොවේ

මෙම න්‍යාය මාර්ගයන්ට අනුව භාව - අභාව, සයංකත - පරංකත, භව - විභව, ශාස්වත - අශාස්වත ආදී සංකල්ප රාශියක් විස්තර වී ඇත. නිදසුනක් ලෙස දී. නි. බ්‍රහ්මජාල සූත්‍රය තුළ,

1. සයංකත

2. පරංකත
3. සයංකතං ච පරංකතං ච
4. අසයං කත අපරංකත

යනුවෙන් මෙම චතුෂ්කෝටිය දක්වේ. මෙහි වන්නා වූ පළමු දෘෂ්ටිය ශාස්වතවාදය පදනම් වූවකි. දෙවැන්න උච්ඡේදවාදය පදනම් වූවකි. තුන්වැන්න පළමු හා දෙවන දෘෂ්ටීන්ගේ සංකලනයකි. සතරවැනි දෘෂ්ටිය සියල්ලේ නිශේධය දක්වන විසංවාදී වූ අදහසක් දක්වන්නකි.

"ශාස්වතවාදය" යනු සියල්ල ඇතැයි සැළකීම යි. නිත්‍ය වූ ආත්මයක් ඇත, එය ශාස්වත ය, සදාකාලික ය, අවිපරිණාමීය යැයි සැළකීම මෙම දෘෂ්ටියෙහි ලක්‍ෂණයයි. ආදි බුදුසමයට අනුව මෙය අන්ත ග්‍රහණයකි. ***''සබ්බං අත්ථීති බො කච්චාන අයමෙකො අන්තො''***[2] දී. නි. බ්‍රහ්මජාල සූත්‍රයේ දී ශාස්වතවාදීහු එම දිෂ්ඨි ග්‍රහණය නිර්මාණය කර ගන්නා වූ ආකාරය පිළිබඳ දක්වේ.

***"ඉති සාකාරං සඋද්දෙසං අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙ එවමාහ. සස්සතො අත්තාච ලොකො ච වඤ්ඣො කූඨට්ඨො එසිකට්ඨායිට්ඨීතො තෙව සත්තා සංධාවන්ති සංසරන්ති චවන්ති උප්පජ්ජන්ති අත්ථිත්වෙව සස්සති සමං***[3]

මෙසේ පූර්වාන්ත කල්පනය තුළින් ආත්මයත් ලෝකයත් ශාස්වතය, නව ඵල උප්පාදනයෙන් තොර බැවින් වඳ ය, ස්ථිර ය, ස්ථාවර ය යනුවෙන් ඒ සත්වයෝ ම සසර ව්‍යුත වෙමින් සැරිසරති, යැයි සිතා ශාස්වතවාදය නිර්මාණය කරගන්නා අයුරු දක්වා ඇත. උච්ඡේදවාදය තුළින් ශාස්වතවාදයේ නිෂේධනය ප්‍රකාශ කරනු ලබයි. එනම් විද්‍යමාන වූ සත්වයාගේ සහ ලෝකයේ උච්ඡේදය විනාශය විභවය සිදීයාම වේ යැයි දැඩිව පිළිගැනීම යි. ***''සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං''***[4] ආත්මයක් නැතැයි පදනම් කරගන්නා වූ උච්ඡේදවාදීහු මරණින් මතු පැවැත්ම ඍජු ලෙසම බැහැර කරති. පරලොව නොපිළිගනිති. ඔවුන් ආත්මය පමණක් නොව සියලුම පාරභෞතික ප්‍රස්තුතයන් ද බැහැර කරති. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව උච්ඡේදවාදීහු කරුණු 07ක් පදනම් කොටගෙන මෙම දෘෂ්ටිය පනවා ගනු ලබයි.

***''සන්ති භික්ඛවේ එකෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති. සත්තහි වත්ථූහි''***[5]

1. ආත්මය මෙම ජීවිතයේදීම විනාශ වේයැයි සැළකීම
2. ආත්මය කාමාවචර දෙව්ලොව දී විනාශ වේ යැයි සැළකීම
3. ආත්මය රූපාවචර බඹලොව දී විනාශ වේ යැයි සැළකීම
4. ආත්මය ආකාසානඤ්චායතනයේ දී විනාශ වේ යැයි සැළකීම
5. ආත්මය විඤ්ඤාණඤ්චායතනයේ දී විනාශ වේ යැයි සැළකීම
6. ආත්මය ආකිඤ්චඤ්ඤායතනයේ දී විනාශ වේ යැයි සැළකීම
7. ආත්මය නේවසඤ්ඤානාසඤ්ඤායතනයේ දී විනාශ වේ යැයි සැළකීම

මෙසේ යම් පැවැත්මක නස්ථ්‍යාර්ථය ප්‍රකාශ කිරීම චතුෂ්කෝටියේ දෙවැනි සංකල්පය තුළින් සිදු වී ඇත.

මෙහි තුන්වන භව්‍යතාවෙහි දක්නට ලැබෙන්නේ පළමු සහ දෙවන භව්‍යතාවයන්ගේ එකතුවකි. එසේම එම භව්‍යතාවෙහි නඤ්ඤාර්ථය සතරවන සංකල්පයෙන් විද්‍යාමාන වේ. හුදෙක් සතරවෙනි භව්‍යතාව තුළ විසංවාදී වූ අදහසක් ඉස්මතු කරනු ලබයි.

මෙසේ චතුෂ්කෝටික න්‍යාය තුළින් සතරාකාර වූ දෘෂ්ටියක් විග්‍රහ වූ නමුදු, දාර්ශනික වශයෙන් එහි පදනම වන්නේ අස්ති - නාස්ති යන ද්විකෝටියම බව පෙනේ. එහෙයින් ශාස්වත උච්ඡේද දෘෂ්ටීන් පමණක් නොව.

***''තං ජීවං තං සරීරං - අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං''***

***''අනන්තවා ලොකො - අනන්තවා ලොකො''***

***''හොති තථාගතො පරං මරණා - න හොති තථාගතො පරං මරණා''***

ආදි අනෙකුත් සියලු දෘෂ්ටි ග්‍රහණයන් ද මෙම ද්විකෝටියට හෝ චතුෂ්කෝටියට අදාළව විග්‍රහ කිරීමට හැකියාව ඇති අයුරු දක්නට ලැබේ.

## චතුෂ්කෝටිය පිළිබඳ ආදි බෞද්ධ ආකල්පය

චතුෂ්කෝටිය පිළිබඳ ආදි බුදුදහම දක්වන ආකල්ප පිළිබඳ විමසා බැලීමේ දී, එහි, චතුෂ්කෝටිය ඇතුළු සියලු අන්ත දෘෂ්ටීන් පසෙකින් තබා මධ්‍යස්ථ වූ ප්‍රතිපදාවක් අනුගමනය කොට ඇති අයුරු දැක්වේ. ම.නි. අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මෙම සියලු දෘෂ්ටි ග්‍රහණයන් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ කවර කරුණක් නිසාදැයි මනාව විස්තර වේ. බුදුරදුන් හමුවීමට පැමිණි වච්ඡගොත්ත ''භවත් ගෞතමයන් වහන්සේ දෘෂ්ටි ග්‍රහණයන්ට නොපැමිණෙන්නේ කවර ආදීනවයක් සැළකීමෙන් දැයි විමසූ විට, බුදුරදුන්ගේ පිළිතුර වූයේ,

***''දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨි කන්තාරං දිට්ඨි විසූකං දිට්ඨි විප්ඵන්දිතං දිට්ඨි සඤ්ඤොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බාණාය සංවත්තති. ඉමං ඛො අහං වච්ඡ ආදීනවං සම්පස්සමානො එවං ඉමානි සබ්බසො දිට්ඨිගතානි අනුපගතොති''***[6]

(මේ සියල්ල දෘෂ්ටිගතයන් ය. දෘෂ්ටි ග්‍රහණයන් ය. දෘෂ්ටි කාන්තාර ය. දෘෂ්ටි මමායිතයන් ය. දෘෂ්ටි සංයෝජනයන් ය. ඒවා දුක් සහගත ය. වෙහෙස සහිත ය. උපායාස බහුල ය. පරිදාහ සහිත ය. නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, සංසිඳීම පිණිස, අවබෝධය පිණිස, සම්බෝධිය පිණිස, නිවීම පිණිස නොපවතියි.)

බුදුන් වහන්සේ මෙම දෘෂ්ටීන්ට නොපැමිණෙන්නේ මෙම ආදීනව සළකා යැයි දේශනා කළහ. මෙහි දී බුදුරදුන්ට කිසියම් දෘෂ්ටියක් ඇත්දැයි වච්ඡගොත්ත විමසූ අතර, එම ප්‍රශ්නයට බුදුරදුන්ගේ පිළිතුර වූයේ, ''දෘෂ්ටිගත ය යන මේ කරුණ තථාගතයන් විසින් බැහැර කරන ලද බව'' යි.

***''අත්ථි පන භොතො ගොතමසස කිඤ්චි දිටඨිගතනති. දිටඨිගතනති ඛො වච්ඡ අපනීතමෙතං තථාගතසස''***[7]

එසේම බුදුසමය යනු කිසිදු දෘෂ්ටි ග්‍රහණයකට නොපැමිණ, දර්ශනයෙන් යුතුව අනුගමනය කළ යුතු ප්‍රතිපදාවක් ලෙස බොහෝ සූත්‍රවල සඳහන් වේ.

***"දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො කාමෙසු විනෙය්‍ය ගෙධං නහිජාති ගබ්බසෙය්‍යං පුනරෙති"***[8]

මෙම සියලු දෘෂ්ටිග්‍රහණයන්ගෙන් විනිර්මුක්ත වීම තුළින් පුද්ගලායට කිසිදු සැකයක් ඇති නොවන ආකාරය බුදුසමයෙහි මෙසේ විස්තර වී ඇත.

***"දිට්ඨි නිරොධා ඛො භික්ඛු සුතවතො අරියසාවකස්ස විචිකිච්ඡා නුප්පජ්ජති"***[9]

එසේම මෙම ශාස්වත උච්ඡේද ආදී වූ නොයෙකුත් දෘෂ්ටිවාද බලපවත්වන කල්හි අර්ථවත් වූ බ්‍රහ්මචරිය වාසයකට, එනම් අර්ථවත් වූ වීර්යාරම්භ කිරීමට අවකාස නොසැලසේ. දෘෂ්ටිග්‍රහයෙන් මිදීම ආචාර විද්‍යාත්මක උපයෝගීතාවයකින් ද යුක්ත වූවකි. මිනිසා තුළ ලෝකය පිළිබඳ ශාස්වත දෘෂ්ටිය තිබේද, ලෝකය පිළිබඳ උච්ඡේද දෘෂ්ටිය තිබේද, ඔහුට බ්‍රහ්මචරිය වාසයක් හෙවත් අර්ථවත් ආගමික ජීවිතයක් නොවන බව ම. නි. මාලුංක්‍ය පුත්ත සූත්‍රයේ ද දැක්වේ.

***"සස්සතො ලොකොති වා මාලුංක්‍ය පුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති. එවං නො අසස්සතො ලොකොති වා මාලුංක්‍ය පුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියාවාසො අභවිස්සාති"***[10]

මෙසේ ආදි බුදුසමයට අනුව සසර දුක නිම නොවී දිගෙන් දිගට පවතිනනේ ආත්මවාදීව අයෝනිසොමනසිකාරයෙන් දෘෂ්ටි ගොඩනගන නිසා ය. නිවැරදි ශාස්තෘත්වයක් නැති තැන මෙම සත්‍යය ලොවට දැනගැනීමට අවකාශ නැති වී යයි. අයෝනිසොමනසිකාරයම නිරන්තරයෙන් සිදු වන නිසා පුද්ගලයා වැරදි දෘෂ්ටීන් හා කල්පනයන් අනුව ක්‍රියා කරයි. ආත්මයක් ඇත. ආත්මයක් නැත. ආදි වශයෙන් ඇති වන මේ දෘෂ්ටීන්හි බැඳෙන සත්‍වයා අශ්‍රැතවත් පෘථග්ජනයෙකු වන බැවින් ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්, දොමනස්සවලින් නොමිදෙන බව සබ්බාසව සූත්‍රයෙහි සඳහන් වේ.

***"දිට්ඨි සංයොජන සංයුත්තො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො න පරිමුච්චති ජාතියා ජරාමරණෙහි සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති ති දුක්ඛස්මාති වදාමි"***[11]

මෙම කාරණාවට අමතරව ආදි බුදුසමයේ නොයෙකුත් සූත්‍ර දේශනා පිළිබඳ විමසා බැලීමේ දී බුදුරජාණන් වහන්සේ සියලු දෘෂ්ටිවාද පසෙකින් තබා මධ්‍යස්ථ වූ පටිච්චසමුප්පාද දේශනාව සිදු කොට ඇති ආකාරය දක්නට ලැබේ. මෙහි දී, දී.නි. අග්ගවච්ඡගොත්ත සූත්‍රය ඉතා වැදගත් වූවකි. එහි දී බුදුරජාණන් වහන්සේ ලොව සියලු දෘෂ්ටි ග්‍රහණයන් අන්ත දෙකක් නියෝජනය නරන බවත්, ඒ තුළ "සියල්ල ඇත" යනු එක් අන්තයක් බවත්, "සියල්ල නැත" යනු අනෙක් අන්තයත් බවත් දේශනා කොට ඇත. බුදුදහම මෙම අන්ත දෙකටම ඇතුළත් නොවී මධ්‍යස්ථව ධර්මය දේශනා කරන බව මෙම සූත්‍රයේ සඳහන් වේ.

***"ද්වෙ විස්සිතොයං කච්චාන ලොකෙ යෙභුය්‍යෙන අත්ථිතා ච නත්ථිතා ච සබ්බං අත්ථිති අයමෙකො අන්තො. සබ්බං නත්ථි ති දුතියො අන්තො. එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති. අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං........."***[12]

මෙසේ බුදුසමයේ මධ්‍යස්ථ දේශනාව නම් පටිච්චසමුප්පාදය යි. එම පටිච්චසමුප්පාද දේශනාව මත පිහිටා බුදුසමය සියලු ගැටලු විවරණය කෙරේ. සත්‍වයාගේ ස්වභාවය, ලෝකයේ ස්වභාවය, තථාගතයන් වහන්සේගේ ස්වභාවය, නිර්වාණයේ ස්වභාවය, කර්මය සහ විපාකය ආදී සියලු දේශනාවන්ට පදනම වන්නේ මෙම පටිච්චසමුප්පාදය යි.

දම්සක් පැවතුම් සූත්‍රය පිළිබඳ විමසා බැලීමේ දී ද බුදුසමය දර්ශනයක් ලෙස පමණක් නොව, ප්‍රතිපදාවක් හෙවත් චරණයක් ලෙස ද මධ්‍යස්ථ වී ඇති ආකාරය දක්නට ලබේ. එහි දී බුදුරජාණන් වහන්සේ නිත්‍ය වූ ආත්මයක් ඇතැයි පිළිගත් ශාස්වතවාදී මහණ බමුණන් ප්‍රතිපදාවක් වශයෙන් අනුගමනය කල අත්තකිලමතානුයෝගය හෙවත් ආත්මය වෙහෙසට දුකට පත් කිරීමේ ප්‍රතිපදාව ද, නිත්‍ය වූ ආත්මයක් නැතැයි පිළිගත් උච්ඡේදවාදී මහණ බමුණන් හැකිතාක් කම් සැප විඳිමින් ඉදිරිපත් කළ කාමසුඛල්ලිකානුයෝගය ද පසෙකින් තබා මධ්‍යස්ථ වූ ප්‍රතිපදාව වන ත්‍රිවිධ ශික්ෂා ඇතුළත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කොට ඇත.

***"ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා. යොචායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථ සංහිතො. යොචායං අත්තකිලමතානුයොගො දුක්ඛො අනරියො අනත්ථ සංහිතො එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය."*** [13]

මීට අමතරව දී. නි. බ්‍රහ්මජාල සූත්‍රය තත්කාලීන භාරතීය සමාජයේ පැවති නොයෙකුත් දෘෂ්ටි මතවාද විග්‍රහ වන්නා වූ ඉතා වැදගත් සූත්‍ර දේශනාවකි. මෙහි දී බුදුරජාණන් වහන්සේ භාරතීය සමාජය පුරා විසිරී පැවති දෘෂ්ටිවාද 62ක් පිළිබඳ කරුණු දක්වා ඇත. ඉන් දෘෂ්ටිවාද 44ක් පූර්වාන්ත කල්පනය හෙවත් ශාස්වතවාදය පදනම් කොටගෙන ද දෘෂ්ටිවාද 18ක් අපරාන්ත කල්පනය හෙවත් උච්ඡේදවාදය පදනම් කරගෙන ද නිර්මාණය වී ඇති විස්තර වේ.

ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් කිසියම් චිත්ත සමාධියක් පදනම් කොටගෙන පූර්ව ජාති සිහි කරනුයේ ආත්මයත් ලෝකයත් ශාස්වත බවත්, ඵල උත්පාදනයෙන් තොර බවත්, නිශ්චල බවත්, ඉන්ද්‍රකීලයක් සේ ස්ථිර බවත් සළකා ඒ සත්‍වයෝ ම භවයෙන් භවයට සැරිසරති. සදාකාලික ධර්ම මෙන් පවතිති යන දෘෂ්ටිය ගනිති. මෙය පූර්වාන්ත කල්පනය හෙවත් ශාස්වතවාදී දෘෂ්ටිය වේ.

***"ඉති සාකාරං සඋද්දෙසං අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සො එවමාහ. සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූඨට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙච සත්තා සංධාවන්ති සංසරන්ති චවන්ති උප්පජ්ජන්ති. අත්‍ථිංත්වෙව සස්සති සමං."*** [14]

එසේම තවත් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් අපරාන්තය මෙනෙහි කරනුයේ මේ ආත්මය රූපීමයයි ද, සතර මහාභූත ධර්මයන්ගෙන් සෑදුම් ලද්දකැයි ද, මව්පිය සබඳතාවයකින් සෑදුම් ලද්දකැයි ද, කය බිඳීමෙන් උච්ඡේදයට පත්වන්නකැයි ද, එය ආත්මය මැනවින් උච්ඡේදයට පත්වීමකැයි ද යනුවෙන් උච්ඡේදවාදය ප්‍රතිජානනය කරති.

***"ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවං වාදී හොති. එවං දිට්ඨියතො බො භො අයං අත්තාරූපි චාතුම්මහාභූතිකො මතා පෙත්තික සම්භවො කායස්සභෙදා උච්ඡිජ්ජන්ති. විනස්සන්ති.***

***න හොති පරමමරණා එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡිනො හොති ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති''[15]***

බුදුරජාණන් වහන්සේ මේ ආකාරයෙන් වූ පූර්වාන්ත සහ අපරාන්ත සියලු දෘෂ්ටීන් පසෙකින් තබා කිසිදු දෘෂ්ටි ග්‍රහණයෙකින් තොරව මධ්‍යස්ථ වූ දේශනාව සිදු කොට ඇත. එනම් පටිච්චසමුප්පාදය යි.

එසේම ම.නි. චූලසකුළුදායි සූත්‍රයේ ද බුදුරජාණන් වහන්සේ අතීත ආත්මය පදනම් වූ පූර්වාන්ත කල්පනය ද, අනාගත ආත්මය පදනම් වූ අපරාන්ත කල්පනය ද බැහැර කොට මධ්‍යස්ථ වූ දේශනාව වන පටිච්චසමුප්පාද දේශනා කරන බව දක්වා ඇත.

***''අපි ච ඛො උදායි තිට්ඨතු පුබ්බන්තු තිට්ඨතු අපරන්තු ධම්මං දෙසිස්සාමි අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං.......''[16]***

තව ද ම.නි. චූල සීහනාද සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ භව දෘෂ්ටියේ ඇලුනේ ද නැත. විභව දෘෂ්ටියට එරෙහි වූයේ ද නැත. විභව දෘෂ්ටියේ ඇලුනේ ද නැත. භව දෘෂ්ටියට එරෙහි වූයේ ද නැත.''***භව දිට්ඨිං අල්ලීනා විභව දිට්ඨිං පටිවිරුද්ධා විභව දිට්ඨිං අල්ලීනා භව දිට්ඨිං පටිවිරුද්ධා''[17]*** යනුවෙන් දක්වා, සියලු තැන මධ්‍යස්ථ වූ ප්‍රතිපදාව දේශනා කොට ඇත.

එසේම බුදුරජාණන් වහන්සේ මාගන්දියට දේශනා කරනු ලබන්නේ ''තමන් වහන්සේ දෘෂ්ටියත්, ශ්‍රැතියත්, තර්ක ඥානයත් ප්‍රමාණ වශයෙන් නොගන්නා බවයි. විමුක්තිගාමී පුද්ගලයා මෙයම සත්‍ය යැයි විවාද නොකරන අතර, සම මානයත් විෂම මානයත් දෙකම බැහැර කොට කිසිදු දෘෂ්ටියකින් තොරව මධ්‍යස්ථ වූ දේශනාව සිදුකරන බව බුද්ධ දේශනාවයි. බුදුසමයට අනුව දෘෂ්ටි පරාවර්තනය මතවාදී ගැටුම් නිර්මාණය කරන්නකි. මැදිහත් බව නසාලන්නකි. දෘෂ්ටිය කුමක් වුව ද, එය ග්‍රහණය කළ තැනැත්තා අන්‍යයන්ට සවන් නොදේ. ඔහුගේ ඉවසීම ද, විචාර පූර්වක බව ද අහෝසි වේ. දෘෂ්ටි ග්‍රාහකයාට තම මතයම පිහිට වේ. ඔහු දෘෂ්ටි නැමැති සිර කඳවුරේ සිරකරුවෙකු වෙයි. විවිධාකාරයෙන් තර්ක විතර්ක කරන දෘෂ්ටි ගතිකයාගේ ස්වාධීනත්වය නැති වී යයි. හෙතෙම තම දෘෂ්ටිය විසින් නටවනු ලබන රූකඩයක් වැනි වේ. එම නිසාා බුදුරජාණන් වහන්සේ සියලු තැන්හි දෘෂ්ටි ග්‍රහණය ප්‍රතික්ෂේප කොට ඇත.

ලොව පවතින්නා වූ "ඇත" යන අන්තයත් "නැත" යන අන්තයත් හුදු සංකල්ප මාත්‍රයක් පමණක් බව බුදුසමයේ අදහසයි යි. එය තුළ ග්‍රහණය කරගත යුතු සත්‍ය ධර්මයක් නොවේ.

***''සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය මුසාති වා සො විවදෙථ කෙන යස්මිං සමං විසමං චාපි නත්ථි ස කෙන වාදං පටිසංයුජෙය්‍ය''[18]***

දෘෂ්ටි ග්‍රහණයෙන් යුකත් වූ පුද්ගලයා ලොව සත්‍ය ධර්මයෙන් තොර වේ.

***''සඤ්ඤං ච දිට්ඨිං ච අග්ගහෙසුං - තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ''[19]***

මේ ආකාරයට ආදි බුදුසමය දෙස බලන කල එය සියලු තැන්හි සියලු දෘෂ්ටි පසෙකින් තබා මධ්‍යස්ථ භාවය ආරක්ෂා කොට ඇති අයුරු දක්නට ලැබේ. චතුෂ්කෝටික තර්ක ක්‍රමය තුළ එහි පදනම ලෙස "ඇත" යන ශාස්වතවාදී අන්තය ද, "නැත" යන උච්ඡේදවාදී අන්තය ද අර්ථවත් වේ.

එම නිසා ආදි බුදුසමය දාර්ශනික වශයෙන් මෙම චතුෂ්කෝටිය ප්‍රතික්ෂේපිත ඥාන මාර්ගයක් ලෙස දක්වා ඇත. ඒ වෙනුවට සියලු අවස්ථාවන්හි මධ්‍යස්ථ භාවයම බුදුසමය තුළ අවධාරණය වේ.

## චතුෂ්කෝටිය පිළිබඳ මාධ්‍යමක විග්‍රහය සහ ආදි බුදුදහම

බුද්ධ පරිනිර්වාණයෙන් පසුකාලීනව බෞද්ධ දර්ශනය නොයෙකුත් අයුරින් විශ්ලේෂණය කිරීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙස නොයෙකුත් සම්ප්‍රදායයන් බිහි වූ අතර, මෙම සියලු සම්ප්‍රදායයන් විශ්ලේෂණය කර බැලිමේ දී කිසිදු දර්ශනයක් තුළ ආදි බුදුදහමේ දක්නට ලැබෙන මධ්‍යස්ථ භාවය නිවැරදි ලෙස ආරක්ෂා කිරීමට සමත් වී නොමැති අයුරු පෙනේ. නිදසුනක් ලෙස සර්වාස්තිවාදීහු පුද්ගලයෙකු හෝ ආත්මයක් නැතැයි තදින් කියා සිටිමින් උච්ඡේදයට නැඹුරු වූ අතර, සම්මිතීය වාත්සීපුත්‍ර වැනි පුද්ගලවාදී බෞද්ධ නිකායන් ඊට ප්‍රතිවිරුද්ධ වීමෙන් ශාස්වතවාදයට නැඹුරු වූහ.

ආදි බුදුසමය මෙම කිසිදු අන්තයකට නොවැටී නිරතුරුවම මධ්‍යස්ථභාවය ආරක්ෂා කොට ඇත. පසුකාලීනව බිහි වූ දාර්ශනික සංකල්ප අතර මෙම මධ්‍යස්ථභාවය බොහෝ දුරට ආරක්ෂා කරමින් ආදි බුදුසමයට දාර්ශනික වශයෙන් ඉතා සමීප වූ ඉගැන්වීමක් ඉදිරිපත් කිරීමට සමත් වූ එකම පිරිස මාධ්‍යමකයන් පමණි. ඔවුන් නිරතුරුවම මධ්‍යස්ථභාවය ආරක්ෂා කිරීමට කටයුතු කොට ඇති අතර, එම නිසාම ඔවුන් තම දර්ශනය "මාධ්‍යමක දර්ශනය" ලෙස හැඳින්වීමට යොමු විය. ආදි බුදුසමයේ විග්‍රහකොට ඇති ද්වයවාදය මාධ්‍යමක දර්ශනයේ පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප වේ. අස්ති - නාස්ති, භාව - අභාව, පූර්වාන්ත - අපරාන්ත, භව - විභව, සයංකත - පරංකත ආදී දෘෂ්ටි ග්‍රහණයකට නොපැමිණි මාධ්‍යමකයෝ නිරතුරුවම මධ්‍යස්ථභාවයෙන් කරුණු දක්වා ඇත.

මාධ්‍යමක දර්ශනයේ නිර්මාතෘවරයා ලෙස සළකනු ලබන ආචාර්ය නාගර්ජුන පාදයන්ගේ ඉගැන්වීම් තුළින් ඔවුන් කොතරම් දුරට දාර්ශනික වශයෙන් ආදි බුදුසමයට සමීපදැයි දැකගත හැකිය. ආදි බුදු සමය තුළ ***"යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති. යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති"*** යනුවෙන් මධ්‍යම දර්ශනය ලෙස අර්ථවත් කරන පටිච්චසමුප්පාද දේශනාව මාධ්‍යමකයෝ ද තම දර්ශනයේ කේන්ද්‍රීය පදනම ලෙස භාවිතා කොට ඇත.

***"යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ - ශූන්‍යතාං තාං ප්‍රචක්ෂ්මහෙ***

***සාප්‍රඥප්තිරුපාදාය - ප්‍රතිපත් සෛව මධ්‍යමා"***[20]

මෙම පටිච්චසමුප්පාදය මත පිහිටා කටයුතු කිරීම නිසා මාධ්‍යමකයෝ ද්විකෝටියට හෝ චතුෂ්කෝටියට ඇතුළත් වී නොමැති අතර ඔවුන් ද ආදි බුදුසමය මෙන් සියලු දෘෂ්ටිවාද ප්‍රතික්ෂේප කොට ඇත. බුදුරජාණන් වහන්සේ කච්චානගොත්ත සූත්‍රය, බ්‍රහ්මජාල සූත්‍රය ආදී බොහෝ සූත්‍රවල අවධාරණය කරනු ලබන අන්තවාදිත්වයෙන් තොරව මධ්‍යස්ථව කටයුතු කිරීම මාධ්‍යමකයෝ ද එලෙසින් ම දක්වා ඇති බව පෙනේ. "ඇත" යන ශාස්වත දෘෂ්ටියත් "නැත" යන උච්ඡේද දෘෂ්ටියත් පසෙකින් තබන ඔවුන් කිසිදු දෘෂ්ටි ග්‍රහණයකට නොවැටී මධ්‍යස්ථව කටයුතු කිරීම විචක්ෂණ වූ තැනැත්තාගේ ලක්ෂණයක් බව දක්වයි.

***"අස්තී ති ශාස්වතග්‍රාහො - නාස්තීත්‍යුච්ඡේදදර්ශනම්***

***තස්මාදස්තීත්වනාස්තිත්වෙ - නාශ්‍රීයෙත විචක්ෂණඃ"***[21]

ථෙරවාද, සර්වාස්තිවාද වැනි ගුරුකුල පුද්ගලයෙකු, ආත්මයක් නැතැයි ආත්මවාදී වූ අතර, ඒ තුළින් ඔවුන් උච්ඡේදයට නැඹුරු විය. සම්මිතීය වාත්සීයපුත්‍ර වැනි නිකායිකයෝ පුද්ගලයෙකු ඇතැයි පිළිගෙන ශාස්වතයට නැඹුරු වුහ. එහෙයින් ඔවුන් ද ආත්ම දෘෂ්ටියට පැමිණ තිබේ. මාධ්‍යමකයෝ මෙම ආත්ම සංකල්ප සම්මුති වශයෙන් පමණක් සළකා ගතයුතු බවත්, බුදුරදුන් විසින් ද එම ආත්ම සංකල්පය භාවිතා කොට ඇතත් උන්වහන්සේ ද එය සම්මුති මාත්‍ර වශයෙන් පමණක් භාවිත කළ බව දක්වයි. උන්වහන්සේ මෙම කිසිදු දෘෂ්ටියක එල්බගෙන නොමැති බව දක්වන මාධ්‍යමකයෝ තමන් ද එම මාර්ගයේ ම ගමන් කරන බව පෙන්වා දෙති.

***''ආත්මෙත්‍යපි ප්‍රඥපිත - මනාත්මෙත්‍යපි දෙශිතම්***

***බුද්ධෛර්නාත්මා න චානාත්මා - කශ්චිදිත්‍යපි දේශිතම්''***[22]

මෙසේ ශාස්වත - අශාස්වත, ආත්ම - අනාත්ම, භව - විභව, භාව - අභාව, අස්ති - නාස්ති, සයංකත - පරංකත, සුද්ධි - අසුද්ධි ආදී වශයෙන් ලෝකයේ පවත්නා ටරසියලු උභයාන්තයන් ආදී බුදුදහම මෙන්ම මාධ්‍යමකයෝ ද පසෙකින් තබමින් මෙම පටිච්චසමුප්පාදයම පදනම් කොටගන්නා අයුරු දක්නට ලැබේ. එසේම චතුෂ්කෝටිය පිළිබඳ මාධ්‍යමක අදහස විමසා බැලිමේ දී ඔවුන් එය ලෝක ව්‍යවහාරයක් පමණක් බව අවධාරණය කොට ඇත.

***''චතුෂ්කොටිකං ච මහාමතෙ ලොකෙ ව්‍යවහාරං''***

ඔවුන් අවධාරණය කරනු ලබන්නේ ද චතුෂ්කෝටියෙන්ම විනිර්මුක්ත වූ සත්‍යතාවයකි.

***''චතුෂ්කොටි විනිර්මුක්තම් තත්වම් මධ්‍යමකා විදුඃ''***

මූලමාධ්‍යමක කාරිකාවට අනුව චතුෂ්කෝටිය ලෙස සළකනු ලබන,

1. සයංකත
2. පරංකත
3. සයංකතං ච පරංකතං ච
4. අසයංකාර අපරංකාර

ආදි සියලු අන්ත මාධ්‍යමක දර්ශනය තුළින් බැහැර වේ.

***''ස්වයං කෘතං පරකෘතං - ද්වාභ්‍යාං කෘතමහෙතුකම්***

***දුඃඛමිත්‍යෙකමිච්ඡන්ති - තච්ච කාර්යං න යුජ්‍යතෙ''***[23]

දුක තමා විසින් කරන ලදැයි හෝ අනුන් විසින් කරන ලදැයි හෝ දෙදෙනා විසින් ම කරන ලදැයි හෝ අහේතුකව සිදුවිණැයි හෝ ඇතැමෙක් පිළිගනිති. එබඳු පිළිගැනීම සුදුසු නොවේ. එසේම තවත් අවස්ථාවක දී මූලමාධ්‍යමකාරිකාව චතුෂ්කෝටිය ප්‍රතික්ෂේප කොට මෙසේ දක්වයි.

***''ශුන්‍යං ඉති න වක්තව්‍යං - මශුන්‍යයං ඉති වා භවෙත්***

***උභයං නොභයං චෙති - ප්‍රඥප්‍යර්ථං තු කථ්‍යතෙ''***[24]

තථාගතයන් වහන්සේ පිළිබඳ "ශූන්‍ය" යැයි හෝ "අශූන්‍ය" යැයි හෝ "ඒ දෙකම" හෝ "ඒ දෙකම නොවේ" යැයි හෝ නොකිව යුතුය. ලෝක සම්මත අර්ථයෙන් පමණක් එසේ කියනු ලබයි. එසේම, උන්වහන්සේ පිළිබඳ නිරෝධයෙන් පසු පවතී. නොපවතී. දෙකම ය, දෙකම නොවේ යැයි ද සැළකිය නොහැකි බව මෙහි දක්වයි.

*"පරං නිරොධාද්භගවාන් - භවතීත්‍යෙව නොහ්‍යතෙ*

*න භවත්‍යුභයං චෙති - නොභයං චෙති නොහ්‍යතෙ"*

නිරෝධයෙන් පසු පමණක් නොව ජීවත් වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ පවා පවතී, නොපවතී, දෙකම ය හා දෙකම නොවේ යනුවෙන් සැළකිය නොහැකි බව මාධ්‍යමකයන්ගේ අදහසයි.

*"තිෂ්ඨමානොපි භගවාන් - භවතීත්‍යෙව නොහ්‍යතෙ*

*න භවත්‍යුභයං චෙති - නොභයං චෙති නොහ්‍යතෙ"*

මීට අමතරව ලෝකය පිළිබඳ දක්වන මූලමාධ්‍යමිකකාරිකාව ලෝකය අන්තවත් ය, අනන්තවත් ය ආදී වූ භව්‍යතා සතරට එය නැගිය නොහැකි බව දක්වන අතර, පුද්ගල චතුෂ්කෝටියෙන් විනිර්මුක්තව සාකච්ඡා කොට ඇත.

*"එවං දෘෂ්ටිරතීතෙ යා - නාභූමහමභූමහම්*

*උභයං නොභයං චෙති - නෛෂා සමුපපද්‍යතෙ"*

මෙසේ මාධ්‍යමකයන් චතුස්කෝටික භව්‍යතා ප්‍රතික්ෂේප කරමින් එම කිසිදු අන්තයකට නොවැටී ආදි බුදුදහම නිරතුරුව අවධාරණය කරනු ලැබූ මධ්‍යස්ථභාවය සුරැකීමට කටයුතු කොට ඇති අතර, ඒ තුළින් ආදි බුදුසමය ප්‍රතික්ෂේප කරනු ලැබූ දායකත්වය මාධ්‍යමික දර්ශනයේ ද ප්‍රතික්ෂේප කොට ඇති අයුරු දැකගත හැකිය. ඒ සඳහා මූලික සූත්‍ර දෙශනාවක් වන කච්චායනගොත්ත සූත්‍රයම උදාහරණයට ගන්නා වූ මාධ්‍යමකයෝ,

*"කෘත්‍යායනාවවාදෙ චාස් - තීති නාස්තීති චොභයම්*

*ප්‍රතිෂිද්ධං භගවතා - භාවභාවවිභාවිනා"*[25]

භාව - අභාව පිළිබඳ දක්නා වූ බුදුරදුන් ඇත - නැත යන අන්ත ප්‍රතික්ෂේප කොට ඇති බව දක්වයි. එසේම "ඇත" යනු ශාස්වතවාද පිළිගැනීම යි. "නැත" යනු උච්ඡේදවාද පිළිගැනීම යි. එහෙයින් බුද්ධිමත් තැනැත්තා මෙම ඇති බව සහ නැති බව යන අන්ත දෙකම ප්‍රතික්ෂේප කරනු ලබන බව මෙහි දැක්වේ.

*"අස්තීති ශාස්වතග්‍රාහො - නාසතීත්‍යුච්ඡේදදර්ශනම්*

*තස්මාදස්තිත්ව නාස්තිත්වෙ - නාශ්‍රීයෙත විචක්ෂණඃ"*

ඒකාර්ථවත් නොවන, නානාර්ථවත් නොවන උච්ඡේද සහ ශාස්වත නොවන මෙය වූ කලී ලෝකනාථ බුදුරජාණන් වහන්සේලාගේ ඉගැන්වීමක් ලෙස මාධ්‍යමිකයෝ පෙන්වා දෙයි.

*''අනෙකාර්ථමනානාර්ථ - මනුච්ඡේදමශාස්වතම්*

*එතත් තල්ලොකනාථානාං - බුද්ධානං ශාසනාමෘතං''*[26]

මෙසේ සියලු දෘෂ්ටි ග්‍රහණයෙන් මිදුණා වූ මාධ්‍යමකයෝ සියලු තැන මධ්‍යස්ථභාවය අවධාරණය කරති. සියල්ලෙහි මධ්‍යස්ථභාවය නම් ශූන්‍යත්‍වය යි. සියල්ල ශූන්‍ය වූ කල අන්තවත්, අනන්තවත් නොවන, දෙකම හා දෙකම නොවන ලෙස සිතීමේ අරුත කුමක් ද? කුමක් නම් එයම හෝ අනිකක් වන්නේ ද? කුමක් නම් සදාකාලික හෝ අසදාකාලික හෝ සදාකාලික හා අසදාකාලික හෝ සදාකාලික හා අසදාකාලික නොවන්නේ හෝ වේ ද යැයි මාධ්‍යමකයෝ විචාරයට ලක්කොට ඇත.

*''ශූන්‍යෙෂු සර්වධර්මෙෂු - කිමනන්තං කිමන්තවත්*

*කිමනන්තමන්තවච්ච - නානන්තං නාන්තවච්ච කිං''*[27]

*''කිං තදෙව කිමන්‍යත් කිං - ශාස්වතං කිමශාස්වතම්*

*අශාස්වතං ශාස්වතං ච - කිං වා නොභයමප්‍යථ''*[28]

මෙසේ ශූන්‍යත්‍වය තුළින් සියල්ලෙහි මධ්‍යස්ථ භාවය අවධාරණය කරනු ලබන මාධ්‍යමිකයෝ කිසිදු අන්තයකට හෝ කිසිදු දෘෂ්ටියකට නොවැටී ඇත. කාරිකාවේ අවසන් ශ්ලොකය තුළින් ද ඔවුන් බුදුරදුන්ට නමස්කාර කරනුයේ සියලු දෘෂ්ටි දුරලීම සඳහා අනුකම්පා පෙර දැරිව ධර්මය කියාදුන් ගෞතමයන් වහන්සේ ට නමස්කාර කරමි යනුවෙනි.

*''සර්වදෘෂ්ටිප්‍රහාණාය - යඃ සද්ධර්මදෙශයත්*

*අනුකම්පාමුපාදාය - තාං නමස්‍යාමි ගෞතමං''*[29]

මේ අකාරයට මූලමාධ්‍යමික කාරිකාව තුළින් මාධ්‍යමකයන් චතුෂ්කෝටියට හෝ ඒ තුළින් අර්ථවත් වන්නා වූ කිසිදු අන්තයකට හෝ දෘෂ්ටි ග්‍රහණයකට ඇතුළත් නොවී ආදි බුදුසමය අවධාරණය කරනු ලැබූ මධ්‍යස්ථභාවය ආරක්‍ෂා කිරීමට සමත් වී ඇත. ඔවුන් ශූන්‍යත්‍වය මඟින් අර්ථවත් කරනු ලැබුවේ කිසිදු අන්තයකට නොවැටී මධ්‍යස්ථව කටයුතු කිරීම යි. එම නිසාම මාධ්‍යමක දර්ශනය ආදි බුදුසමයට ඉතා සමීප වූ ඉගැන්වීමක් ලෙස දැක්විය හැක. ආදි බුදුසමය නිරන්තරයෙන් මධ්‍යස්ථ වූවා සේම මාධ්‍යමකයෝ ද නිරතුරුවම මධ්‍යස්ථ වූහ. ආදි බුදු දහම තුළ පටිච්චසමුප්පාදය පදනම වූවා සේම මාධ්‍යමක දර්ශනයේ ද පටිච්චසමුප්පාදය පදනම් වූ ආකාරය දක්නට ලැබේ.

---

[1] සං. නි. II, කච්චායනගොත්ත සුත්ත
[2] සං. නි. II, කච්චායනගොත්ත සුත්ත
[3] දී. නි. බ්‍රහ්මජාල සුත්ත
[4] දී. නි. බ්‍රහ්මජාල සුත්ත
[5] දී. නි. බ්‍රහ්මජාල සුත්ත

[6] ම. නි. II, අග්ගිවච්ඡගොත්ත සුත්ත, 260 පිට, බු. ජ. මු.
[7] ම. නි. II, අග්ගිවච්ඡගොත්ත සුත්ත, 260 පිට, බු. ජ. මු.
[8] සුත්ත නිපාතය, මෙත්ත සුත්ත, 46 පිට, බු. ජ. මු.
[9] අං. නි. IV, අව්‍යාකතවත්ථු සුත්ත, 380 පිට, බු. ජ. මු.
[10] ම. නි. II, මාලුංක්‍යපුත්ත සුත්ත, 158 පිට, බු. ජ. මු.
[11] ම. නි. I, සබ්බාසව සුත්ත, 22 පිට, බු. ජ. මු.
[12] ම. නි. II, කච්චායනගොත්ත සුත්ත
[13] සං. නි. V, ධම්මචක්කපවත්තන සුත්ත
[14] දී. නි. I, බ්‍රහ්මජාල සුත්ත, 54 පිට, බු. ජ. මු.
[15] දී. නි. II, බ්‍රහ්මජාල සුත්ත, 60 පිට, බු. ජ. මු.
[16] ම. නි., චූලසකුළුදායි සුත්ත
[17] ම. නි., චූලසීහනාද සුත්ත
[18] සුත්ත නිපාතය, මාගන්දිය සුත්ත
[19] සුත්ත නිපාතය, මාගන්දිය සුත්ත
[20] මූලමාධ්‍යමික කාරිකා, 24 පරිච්ඡේදය, 18 ශෙලාකය
[21] මූලමාධ්‍යමික කාරිකා, 15 පරිච්ඡේදය, 10 ශෙලාකය
[22] මූලමාධ්‍යමික කාරිකා, 18 පරිච්ඡේදය, 06 ශෙලාකය
[23] මූලමාධ්‍යමික කාරිකා, 12 පරිච්ඡේදය, 01 ශෙලාකය
[24] මූලමාධ්‍යමික කාරිකා, 22 පරිච්ඡේදය, 11 ශෙලාකය
[25] මූලමාධ්‍යමික කාරිකා, 15 පරිච්ඡේදය, 07 ශෙලාකය
[26] මූලමාධ්‍යමික කාරිකා, 18 පරිච්ඡේදය, 11 ශෙලාකය
[27] මූලමාධ්‍යමික කාරිකා, 25 පරිච්ඡේදය, 22 ශෙලාකය
[28] මූලමාධ්‍යමික කාරිකා, 25 පරිච්ඡේදය, 23 ශෙලාකය
[29] මූලමාධ්‍යමික කාරිකා, 27 පරිච්ඡේදය, 30 ශෙලාකය